# මෑතක අනාවරණය වූ බ්‍රාහ්මී සෙල්ලිපි කීපයක් පිළිබඳ සටහනක්

**එච්. ජී. දයාසිසිර [1], චන්දිම බණ්ඩාර අඹන්වල [2]**

දිවයිනේ මානව යටගියාව පිළිබඳ දීර්ග කථාවේ සංධිස්ථානයක් වශයෙන් අක්‍ෂර කලාව පිළිබඳ අදහස හඳුනා ගත හැකි වේ. දළ වශයෙන් ක්‍රිස්තු පූර්ව තෙවන සියවස පමණ කාලයට අයත් යැයි වියතුන් විසින් පෙන්වා දෙන පූර්ව බ්‍රාහ්මී සෙල්ලිපි දිවයිනේ පැරණිතම ලිපි වශයෙන් වියතුන් විසින් දැනට පොදුවේ පිළි ගෙන ඇත. පූර්ව බ්‍රාහ්මී යුගයට අයත් යැයි හඳුනා ගන්නා ලිපි උතුරු ප්‍රදේශය හැර දිවයිනේ අනෙකුත් සෑම තැනැක්ම නියෝජනය වන පරිදි අවම වශයෙන් 3,000කට වඩා වැඩි ප්‍රමාණයක් ඇති බව පෙනී ගොස් ඇත. මෙවැනි ලිපි සම්බන්ධයෙන් දිවයිනේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වර හැරී චාල්ස් පර්විස් බෙල්ගේ සිට මහාචාර්ය සෙනරත් පරණවිතාන හරහා වත්මන දක්වා ම විවිධ වියතුන් විසින් අවධානය යොමු කැරැ ඇති බව පෙනී යයි.

මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් 2007 දෙසැම්බර් හා 2008 ජනවාරි මාසයන් හි දී කරන ලද ගවේෂණයන්ගෙන් අණාවරණය කර ගන්නා ලද අම්පාර, බදුල්ල හා මහනුවර යන දිස්ත්‍රික්කයනට අයත් දඹාන - කිරිපොකුණ කන්ද, ලූණුබොක්ක නාගිරි ආරණ්‍ය සේනාසනය, මොරගොම්මන - ඉනුල්දෙණියගොඩකන්ද, සෙණසුන්ගල රජමහා විහාරය, ටැම්ගොඩ රජමහා විහාරය, පහළ මාවෙල කන්දේ රජමහා විහාරය, ගින්නෝරුව කන්ද යන ස්ථානයන්ගෙන් අණාවරණය කැරැ ගන්නා ලද බ්‍රාහ්මී ලිපි කීපයක් පිළිබඳ මූලික විස්තරයක් ඉදිරිපත් කරනු ලැබේ.

පුරා අක්‍ෂර විද්‍යාත්මක වශයෙන් එම ලිපි සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී ඒවා අතර වෙසෙස් ලකුණු ඇති බව පෙනී යයි. සමාජ පුරාවිද්‍යාත්මක වශයෙන් ලිපි පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී විවිධ ජන කණ්ඩායම් පිළිබඳ තොරතුරු

[1] පුරාවිද්‍යා පර්යේෂණ සම්බන්ධීකාරක

ඊමේල්: dayasisirahewagamage@yahoo.com

[2] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය.

ඊමේල්: chndimaambanwla@yahoo.com

ඒවායින් අණාවරණය වන බව පෙනේ. අශ, අතිචොද, පරුමක, ගමික ආදි අභිධාන එම ලිපි හා ආබද්ධ පුද්ගල නාම සමඟ ඊට පූර්වයෙන් යෙදී ඇත. නාම පද පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ශුමණගුත, තිශ, දෙත, වාහ, බතිම, අමඋතර ආදි වශයෙන් සාධක ලැබේ. මෙම ලිපි බහුතරයක් ම සංඝයා වෙනුවෙන් වෙන් කළ බවට එම ලිපි තුළින් ම තොරතුරු ඉදිරිපත් වේ. මාවෙල විහාර ලිපියේ අභිලේඛනාත්මක වටිනාකම මෙන් ම කාලනීර්ණ උපයෝගිතාත්මක වටිනාකමක් ද ඇති බව නිශ්චය කළ හැකි වේ.

**ප්‍රමුඛ පදඃ** බ්‍රාහ්මී සෙල්ලිපි, මාවෙල විහාර ලිපිය
**Title:** A note on some recently discovered Brahmi inscriptions
**Keywords:** Brahmi inscriptions, Mawela Vihara inscription